## දේශපාලනීකරණය වූ පරිසරය සහ නාගරික ගංවතුර ආපදාව: සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක්


අබේවර්ධන ඩී. එම්. වයි.[1]

[1]සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

dinuyapa93@gmail.com



### සාර සංක්ෂේපය

තුන්වන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව මුහුණදෙන අර්බුද අතර පාරිසරික අර්බුද ප්‍රමුඛස්ථානයක පවතී. මෙවන් පාරිසරික අර්බුද අතරට අයත්වන ස්වභාවික ආපදා, තිරසාර සංවර්ධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ඍජු බාධකයක් බවට පත්වී හමාරය. එවන් ස්වභාවික ආපදා අතුරින් ශ්‍රී ලංකාව මුහුණදෙන නියඟය හැරුණු විට, දෙවන විශාලතම ආපදාව වශයෙන් ගංවතුර ආපදා තත්ත්වය හඳුනාගත හැකිය. ගංවතුර ආපදා තත්ත්වය ස්වභාවික පාරිසරික ක්‍රියාවලීන්ගේ පමණක් නොව මානව ක්‍රියාකාරකම්වල අතුරු ඵලයක් වශයෙන්ද නිර්මාණය විය හැකිය. එහෙයින් එසේ ඇතිවන ආපදා තත්ත්ව හා සන්දර්භානුගතව උත්පාදනය වන බල ව්‍යුහ, ඒවායෙහි ක්‍රියාකාරීත්වය සහ මැදිහත්වීම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒ අනුව මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ, "ගංවතුර ආපදා සන්දර්භය උත්පාදනය වීමට සහ එහි ක්‍රියාකාරීත්වයට බල සම්බන්ධතා හරහා කුමනාකාර බලපෑමක් සිදු කරන්නේද?" යන්නයි. එහිලා මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ගංවතුර ආපදා තත්ත්වය උත්පාදනය වීමටත්, එහි බලපෑම් අඩු කිරීමට හෝ වැඩි කිරීමට බල සම්බන්ධතාවයන්ගේ බලපෑම විශ්ලේෂණය කිරීමත්ය. කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර බලපෑමට ලක්වන ග්‍රාම නිළධාරී වසමක් පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරාගන්නා ලදී. අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තෝරාගත් ප්‍රතිග්‍රාහකයින් 40 ක නියැදියක් ඔස්සේ පර්යේෂණය සඳහා දත්ත එක් රැස් කරගැනුණි. එහිලා ප්‍රශ්නාවලි විධික්‍රමයත්, සම්මුඛ සාකච්ඡා විධික්‍රමයත් මිශ්‍ර වශයෙන් යොදාගනු ලැබුණි. පූර්ව ආපදා අවස්ථාවන්හිදී මෙන්ම, ආපදාව සිදුවන සන්දර්භයේදී බල දේශපාලනික ප්‍රතිරූප යාවත්කාලීන වීමද සිදුවන අතර, මාධ්‍යය ආධිපත්‍යධාරී බල ව්‍යුහයක් බවට පත් වේ. පශ්චාත් ව්‍යුහවාදී මතධාරීන්ට අනුව දැනුම යන්න බලය උත්පාදනය කරන මාධ්‍යයක් වන සේම, දැනුම පාලනය කරන මාධ්‍යයක් බවට බලය පත්වන බව සනාථ කිරීමටද ආපදා සන්දර්භය ඉවහල් වේ. එසේම, ආපදා අවස්ථාවන්හිදී මෙන්ම පශ්චාත් ආපදා සන්දර්භයේදී ක්‍රියාකාරී වන බාහිර බල ව්‍යුහ සහ ආපදාපන්න ප්‍රජාව තුළින්ම ඉස්මතු වන බල ව්‍යුහ අදාළ අවස්ථා කළමනාකරණය සඳහා විෂම ආකාරයෙන් ධනාත්මක සේම ඍණාත්මක දායකත්වයන් සපයයි. අනෙක් අතට ආපදා සහන සැළසීමේ අදියරේදී දේශපාලනඥයින්ගේ සංකේත සහ ප්‍රතිරූප යාවත්කාලීන කරගැනීමේ, ව්‍යාජ යථාර්ථයන් නිර්මාණය කරන්නාවූ සන්දර්භයන් බවටද දේශපාලනීකරණය වූ ආපදා සන්දර්භ පත්වී තිබේ. තවදුරටත්, දේශපාලනය තුළින් ආපදාවක් ඇති විය හැකි සේම ආපදාව තුළින්ද දේශපාලනයක් ඇති විය හැකිය යන්න මෙම සන්දර්භයන් විමසීමේදී පැහැදිලි වේ.



***මූල පද:*** *අනුග්‍රාහක සේවාදායක සම්බන්ධතා, ආපදා, ආභාෂණය, ගංවතුර, වාණිජකරණය, පාරිසරික දේශපාලනය, සංකේත පරිභෝජනය, සංවර්ධනය, පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාමූල බල ව්‍යුහ*


---

[1] කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 1. පසුබිම

පැරණි ග්‍රීක ජනතාව තම භාෂාවෙන් පරිසරය හැඳින්වූයේ "ඔයිකස්" (Oikes) යනුවෙනි. එහි අර්ථය තමා ජීවත්වන වටපිටාව වන අතර එමඟින් අන්තර් සම්බන්ධතාවයක් පෙන්වයි. සකලවිධ ජීවීන්, ඔවුන් අතර පවතින අන්තර් සම්බන්ධතා සහ ඔවුන්ගේ පැවැත්ම කෙරෙහි දායක වන සියලුම ක්‍රියාවලීන් එයට අයත් වේ (ධනපාල සහ ආරියසේන, 2004: 04). පාරිසරික ගැටලු මුල්කාලීනව පාරිසරික විද්‍යාඥයින්ගේ අධ්‍යයන පථයට සීමා වී පැවති බව අප දන්නා කරුණකි. නමුත් පාරිසරික ගැටලු සැබෑ ලෙසම ස්වභාවික විද්‍යාව හරහා පමණක් නිරාකරණය කළ හැකිද යන්න නැවත නැවතත් අවධානයට ලක්වූ කරුණක්ම විය. ඒ අනුව පරිසර ගැටලුවක් සමාජ ගැටලුවක් ලෙස අධ්‍යයනය කළ යුතු බවට අදහස් ඉදිරිපත් වූ අතර, මේ සම්බන්ධව සමාජ විද්‍යාඥයින් අතර මුල් කාලීනව පැවතියේ විවාදාත්මක මතවාදයකි. කෙසේ නමුත්, ආසන්නතම දශක ද්විත්වය තුළ සමාජ විද්‍යාඥයින්, පාරිසරික ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇති අතර, පාරිසරික ගැටලු හඳුනාගැනීම හා ඒවාට සුදුසු විසඳුම් සෙවීම සම්බන්ධයෙන් සමාජ විද්‍යාඥයින්ගේ කාර්යභාරයේ ඇති වැදගත්කම පාරිසරික ක්ෂේත්‍රය තුළ කෙමෙන් පිළිගැනීමක්ද සිදුවිය.

ඒ අනුව කිසියම් පාරිසරික ගැටලුවක් සමාජය තුළ සාකච්ඡා වන්නේ නම්, ඒවා හේතුවෙන් ඇතිවන බලපෑම අවම කර ගැනීමට හෝ සීමා කිරීමට මිනිසුන් උත්සාහ කරන්නේ නම්, එවන්නක් සමාජ ගැටලුවක් ලෙස අධ්‍යයනය කළ හැකි හෙයින් පාරිසරික ගැටලු බොහෝමයකට සමාජීය සාධකයන්හි බලපෑම නිතැතින්ම පවතින බවට වන කථිකාව වර්තමානයේ ප්‍රකට වේ. එමෙන්ම මෙසේ පාරිසරික ගැටලු සමාජීය වශයෙන් සංස්කරණය වීමට ජනමාධ්‍යය සහ සමාජීය සාධක මඟින් ගොඩනංවනු ලබන සමාජ යථාර්ථයන්ද  බලපානු ලැබේ (Berger and Luckmann, 1966).

පාරිසරික ගැටලු අතරින් සමාජ ගැටලු ලෙස සාකච්ඡාවට බඳුන් කළ හැකි තත්ත්වයන් වශයෙන් ආපදා නැතහොත් ව්‍යසන තත්ත්වයන් හඳුනාගැනීම වැදගත් වේ. Barton (1969) ප්‍රකාශ කරන ආකාරයට ආපදාවක් යනු, යම්කිසි සමාජයක ශක්තීන් සහ සම්පත්වල උපයෝගීතාවයෙන් ඔබ්බට ගිය, ප්‍රජාව සහ සමාජය මත ව්‍යසනකාරී ලෙස බලපෑම් ඇති කරන්නාවූ, පුද්ගලමය, ද්‍රව්‍යමය හා පාරිසරික අලාභහානි ඇතිකරවනසුලු හදිසි තත්ත්වයයි (International Federation of Red Cross, 2015: 02). ඒ අනුව ආපදා හරහා සමාජයේ මතුපිට ස්වරූපයට, පරිසරයට හා තාක්ෂණයට ප්‍රධාන වශයෙන්ම අභියෝග කරනු ලැබේ (Smith, 1996: 303). ආපදා මූලිකවම ස්වභාවික සහ මිනිසුන් විසින් නිර්මාණය කරන ලද ආපදා වශයෙන් කොටස් ද්විත්වයකින් හඳුනාගත හැකිය.

උක්ත සඳහන් කළ ආපදා ගණයෙහිලා ගැනෙන "ගංවතුර" නැතහොත් "ජල ගැලීම්"  ස්වභාවික උපද්‍රව අතුරින් ජල කාලගුණ විද්‍යාත්මක උපද්‍රවයක් ලෙස සැළකේ. ඒ අනුව ගංවතුර යනු "ජල අතිරේකය හෝ ජල ඌණතාවය යන අවස්ථා ද්විත්වය තුළම ඇතිවන උපද්‍රව කාණ්ඩයට අයත් වන, දිනකට පැය 24ක් තුළ ඉහළ තීව්‍රතාවයකින් යුතුව මිලිමීටර් 200 (200mm) ඉක්මවා ලැබෙන වර්ෂාපතනයේ ප්‍රතිඵලයක්" ලෙස භූගෝල විද්‍යාත්මක සංරචක මත පිහිටා නිර්වචනය කළ හැකිය (රත්නායක, 2007: 34).

ලෝකයේ ස්වභාවික උපද්‍රව අතර වාර්තා වී ඇති උපද්‍රව සංඛ්‍යාව අනුවත්, මුළු අලාභහානි ප්‍රමාණය අනුවත් මෙම උපද්‍රවය ප්‍රධාන තැනක් හිමිකරගනී. වර්ෂ 1900 - 2006 කාලය තුළ ලොව වාර්තා වූ

ස්වභාවික ආපදා වලින් 30%කට ආසන්න ප්‍රමාණයක් ගංවතුර සංසිද්ධීන්ය. ශ්‍රී ලංකාව කෙරෙහි බලපවත්නා ස්වභාවික උපද්‍රව අතරද ගංවතුර ප්‍රධාන තැනක් හිමි කරගෙන තිබේ. ශ්‍රී ලංකාවේ බලපවත්වන්නාවූ ස්වභාවික උපද්‍රව අතුරින් නියඟය හැරුණු විට විශාල ප්‍රදේශයක් කරා බලපවත්වන්නාවූ එකම උපද්‍රවය වනුයේ ගංවතුර උපද්‍රවයයි (ජයසිංහ, 2014: 07).

ඒ අනුව ස්වභාවික තලයේ මෙන්ම මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදාවක් ලෙසද සැළකෙන ගංවතුර හා සම්බන්ධ සාකච්ඡා ගණනාවක් මෑත කාලයේදී ඉස්මතු වුවද මෙම පර්යේෂණය හරහා ඒ හා බැඳුණු බල සම්බන්ධතා සහ පාරිසරික දේශපාලනය පිළිබඳව අවධානය යොමු කෙරිණි. එක් අතකින් ගංවතුර ඇති කිරීමට මෙන්ම අනෙක් අතින් නාගරික ජනතාවගේ ජීවන අරමුණු වෙනස් කිරීමටත් මෙම බල සම්බන්ධතා මඟින් බලපෑම් කිරීමක් පවතී. එබැවින් ගංවතුර ප්‍රශ්නය මතු කිරීමට හෝ අවම කිරීමට බල සම්බන්ධතාවන්ට පවතින හැකියාව සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කෙරේ.

ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ, *"ප්‍රදේශයේ පවත්නා දේශපාලන බල ව්‍යුහය ඇතුළු බල සම්බන්ධතා ගංවතුර ප්‍රශ්නය මතුකිරීමට හෝ අවම කිරීමට බලපානුයේ කෙසේද ?"* යන්නයි. ඒ අනුව මෙහි ප්‍රධාන අරමුණ වශයෙන්, "ගංවතුර හා බැඳි ප්‍රදේශයේ පවතින බල සම්බන්ධතාවල ස්වරූපය හා ඒවායෙහි මැදිහත්වීම හඳුනාගැනීම" වේ.

ඒ යටතේ, උප අරමුණු වශයෙන්,

- ආපදා දේශපාලනීකරණය වන ආකාරය විභාග කිරීම.
- බල දේශපාලනය හා බැඳුණු ගංවතුර ආපදා සන්දර්භයේ ස්වභාවය විශ්ලේෂණය කිරීම.
- ගංවතුර සන්දර්භය තුළ උත්පාදනය වන බල ව්‍යුහ හඳුනාගැනීම.

දැක්විය හැකිය.

**2. ක්‍රමවේදය**

ගවේශනාත්මක පර්යේෂණයක් වන මෙය මිශ්‍ර පර්යේෂණ විධික්‍රම භාවිතා කරමින් සිදු කෙරිණි. එහිලා, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිළධාරී වසමක් පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරාගන්නා ලදී. 389ක් වන පාදක ග්‍රාම නිළධාරී වසමේ සම්පූර්ණ පවුල් සංඛ්‍යාවම 2016 වර්ෂයේ ගංවතුර තත්ත්වයට මුහුණදී තිබෙන හෙයින්, ඔවුන් නියෝජනය වන පරිදි පවුල් 40ක් අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලදී.

ඔවුන් 40 දෙනා වෙත කේතගත කරන ලද විවෘත අන්ත සහිත ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්නාවලි ලබාදුන් අතර, ඒ හරහා මූලික සමාජ - ආර්ථික දත්ත සහ අදාළ සංසිද්ධියේ බලපෑම පිළිබඳව දළ අවබෝධයක් ලබාගැනීම අරමුණු විය. ප්‍රශ්නාවලි 40ට පිළිතුරු ලබාදුන් 40 දෙනා අතුරින් අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සඳහා අරමුණු සහගතව දස දෙනෙක් තෝරාගන්නා ලදී. මීට අමතරව, ප්‍රධාන දත්ත දායකයින් පස් දෙනෙක් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එසේම සරල නිරීක්ෂණයද විධික්‍රමයක් වශයෙන් අධ්‍යයනයේදී භාවිතා කෙරිණි. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වශයෙන් ලබාගත් දත්ත, පිළිවෙළින් SPSS මෘදුකාංගය භාවිතයෙන් සහ තේමා අන්තර්ගත විශ්ලේෂණ විධික්‍රමය උපයුක්ත කරගෙන විශ්ලේෂණයට බඳුන් කෙරිණි.

## 3. සාහිත්‍ය විමර්ෂණය

### 3.1 පාරිසරික දේශපාලනය සහ ආපදා දේශපාලනීකරණය

දේශපාලනීකරණය වූ පරිසරය අසාමාන්‍ය ලෙස දේශපාලනය සමග බැඳී පවතිනුයේ කෙසේද යන්න පාරිසරික දේශපාලනය හරහා සාකච්ඡා කෙරේ. ඉතිහාසයේ අන් කවරදාටත් වඩා පරිසරය පිළිබඳ දේශපාලනය ඉතා තීරණාත්මක සාධකයක් බවට පත්වී ඇත. Bryant and Bailey (1997) දක්වන ආකාරයට දේශපාලන පරිසර විද්‍යාව; දේශපාලනීකරණයට ලක් වූ පරිසරය හා සම්බන්ධ අසමාන බල සම්බන්ධතාවයන් මෙන්ම භෞතික ලෝකය පිළිබඳ දේශපාලන ගතිකත්වය විශ්ලේෂණය කරනු ලැබේ.

කාල් මාක්ස් සහ එංගල්ස් පරිසරය පිළිබඳව ඍජු අදහස් ඉදිරිපත් නොකළ නමුත් ඔවුන්ගේ ධනවාදයට එරෙහි අදහස් වක්‍රව පරිසර මතවාදයට බලපෑම් කරන ලද බව Foster (2000) ප්‍රකාශ කර තිබේ. එමෙන්ම කාල් මාක්ස්ගේ ආර්ථිකය පිළිබඳ අදහස්වලට අනුව ධනවාදය තුළ සොබාදහම යනු, වෙළඳපොලේ විකිණීමට සහ පරිභෝජනය කළ හැකි භාණ්ඩයක් ලෙස වර්තමානයේ සැළකෙන අතර, එහෙයින්ම ස්වභාවික සම්පත් එක්තරා ප්‍රාග්ධනයක් සහ පුද්ගලික ලාභයක් ලෙස සළකනු ලැබේ (මහීෂ්, 2012: 29).

Gare (1992) ප්‍රකාශ කරන ආකාරයට ධනවාදය හරහා ස්වභාවධර්මය සහ මිනිසා අතර ඇති සම්බන්ධතාවය විනාශ කර, ස්වභාවධර්මය ප්‍රයෝජනයට ගනිමින් ලාභ ඉපයීම සඳහා වැඩි වශයෙන් භාණ්ඩ නිශ්පාදනය කරනු ලැබේ (Gare උපුටාගත්තේ, Mahees, 2010). එමෙන්ම Stott and Sullivan (2000) ප්‍රකාශ කරන ආකාරයට පරිසර ප්‍රශ්නවලදී පරිසරය දේශපාලනික වශයෙන් අසමතුලිතභාවයට පත්වේ. ඒ අනුව පාරිසරික දේශපාලනය මුල් කරගත් බල සම්බන්ධතා හරහා පරිසර ගැටලු උත්පාදනයට බලපෑම් ඇති කරන බව පෙනී යයි.

පශ්චාත් නූතනවාදී චින්තකයෙකු වන Michel Foucault විසින් පාරිසරික ගැටලු පිළිබඳව ඍජුව අදහස් ඉදිරිපත් නොකළ නමුත්, මොහුගේ විග්‍රහයන් පරිසර ගැටලු දේශපාලනික ප්‍රවේශයකින් අවබෝධ කර ගැනීමට ඉතාම වැදගත් වේ. විශේෂයෙන්ම ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන ජෛව දේශපාලනයේ (Bio - Politics) එක් ව්‍යාප්තියක් වශයෙන් සැළකිය හැකි බලය සහ දැනුම පිළිබඳ කථිකාව (Power - Knowledge) වර්තමාන සමාජයේ පාරිසරික ගැටලු විග්‍රහ කිරීමෙහිලා ඉතාම වැදගත් වේ (මහීෂ්, 2012). ඒ අනුව Foucault ගේ දැනුම සහ බලය පිළිබඳ කථිකාව තුළින් පාරිසරික අර්බුද කථිකාවන් වශයෙන් නිර්මාණය කිරීමටත්, ඒවා ක්‍රියාවට නංවන ආකාරය සහ පාලනය කරන ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමටත් අවශ්‍ය පසුබිමක් සකස් කර දේ (Darier, 1999).

### 3.2 තුන්වන ලොකයේ දේශපාලන පරිසර විද්‍යාව

තුන්වන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යාව වශයෙන් ඇතිවී තිබෙන නව ප්‍රවේශය සංවර්ධනය වෙමින් පවතින රටවල්වල දේශපාලනය හා පරිසරය අතර සම්බන්ධතාවය වඩාත් ගැඹුරින් අවබෝධ කර ගැනීමට වැදගත් වේ. ඒ අනුව තුන්වන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යාව මඟින් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල දේශපාලන ආර්ථිකය සහ එම සමාජයන්හි සංස්කෘතීන් පදනම් කරගෙන

තුන්වන ලෝකයේ ජන සමාජය සහ ස්වභාවික ලෝකය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව ගැඹුරින් හා විවේචනාත්මකව අධ්‍යයනය කරනු ලැබේ (මහීෂ්, 2012: 30).

Bryant and Bailey (1997) තුන්වන ලෝකයේ පරිසර දේශපාලන විද්‍යාව පිළිබඳව විග්‍රහ කරමින් දක්වන ආකාරයට දියුණු වෙමින් පවතින තුන්වන ලෝකයේ රටවල්වල සංස්කෘතිය හා ස්වභාවදහම, දේශපාලන බල සම්බන්ධතාවයන් තුළින් අවබෝධ කරගත හැකිය. පරිසර කළමනාකරණයේදී සහ පරිසර සංරක්ෂණයේදී නොයෙකුත් පාර්ශවකරුවන් සිටී. එබැවින් පරිසරය හා සම්බන්ධ ක්‍රියාදාමයේදී පාරිසරික නොවන සාධක, විශේෂයෙන්ම දේශපාලනය බෙහෙවින් වැදගත් වේය යන්න මොවුන් පෙන්වා දේ. තුන්වන ලෝකයේ රාජ්‍යයන්හි පාරිසරික සම්පත් කළමනාකරණයේදී සහ භුක්ති විඳීමේදී රාජ්‍ය නොවන සංවිධාන ආදී පාර්ශවකරුවන් සිටියත්, රාජ්‍ය ඒවා අතර ප්‍රධාන වේ. එබැවින් තුන්වන ලෝකයේ පරිසර විනාශයට වැඩි වශයෙන්ම වගකිව යුත්තේ රාජ්‍ය බව මොවුන් දක්වයි. ලෝකයේ රටවල් ධනවාදී රටවල්, සමාජවාදී රටවල් සහ දියුණු වෙමින් පවතින රටවල් ලෙස දේශපාලනික වශයෙන් වර්ග වේ. ඒ අනුව දියුණු වෙමින් පවතින තුන්වන ලෝකයේ රටවල්වල සමාජ තුළ දේශපාලනික වශයෙන් නිර්මාණය වී පවතින ආර්ථික, සමාජ විෂමතාවයන් පරිසරය කෙරෙහි කොපමණ බලපෑම් කරන්නේද යන්න තුන්වන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යා ප්‍රවේශයේදී විමසා බලයි.

එමෙන්ම, ස්වභාවික සම්පත්වල භාරකාරීත්වය සහ අයිතිය සමාජය සතු වන්නක්, එනම් ප්‍රජාව සතු දෙයක්ය යන්න තුන්වන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යාව පිළිබඳ සාකච්ඡාවන්හිදී අවධාරණය කරන්නක් බව කිව යුතුය.

## 4. සොයාගැනීම් සහ සාකච්ඡාව

### 4.1 ආපදා දේශපාලනීකරණය සහ අනුග්‍රාහක ප්‍රජාව

ගංවතුර වැනි ආපදා අවස්ථාවන්හිදී පරිසරය පිළිබඳ දේශපාලනය ඉතා තීරණාත්මක සාධකයක් බවට පත්වී ඇති බව මෙම අධ්‍යයනයේදී හඳුනාගත හැකිවිය. විශේෂයෙන්ම ආපදා තත්ත්ව ඇති කිරීමෙහිලා සාමාන්‍ය ජනතාවගේ දුර්වල පාරිසරික සවිඥානිකත්වය බලපාන අවස්ථා පවතින බව දැකගත හැකි අවස්ථා පවතින නමුත්, ඔවුන් පමණක්ම පරිසරයට දුෂ්කෘත්‍යාත්මක වී නැත. එනම් ආපදා තත්ත්ව ලෙස ගංවතුර තත්ත්වයන්හි බලපෑම වර්ධනය වීමට දේශපාලනඥයිගේ දායකත්වයද හේතුවන බව කිව හැකිය. මේ බව අධ්‍යයන දත්ත ඔස්සේ විග්‍රහ කළ හැකිය.

> "මිනිස්සු අනවසර ඉඩම්වල ගෙවල් හැදුවත්, ඉඩම් ගොඩකරත් කවුරුත් එයාලට විරුද්ධව නඩු දාන්නෙ නෑ. ගොඩක් සාමාන්‍ය මිනිස්සු ගොඩ කරන්නෙ පොඩි ඉඩම්. ඊටත් වඩා වැඩපොළවල් එහෙම හදන්න ව්‍යාපාරිකයො ලොකු ඉඩම් ගොඩ කරද්දි දේශපාලනේ සහයත් තියන නිසා ඒ අයත් කැමති විදියට ඒවා කරනවා. අනවසරෙන් හදල තියෙන ගෙවල්වලට කවුරුත් විරුද්ධ වෙන්නෙත් නෑ. ඡන්දෙ කාලෙට ඇමතිවරු ඇවිත් ඒ අනවසරෙන් හදල තියෙන ගෙවල්වලට කරන්ට්, වතුර වගේ අඩුපාඩුත් දෙනවා..." (ගැඹුරු සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

ප්‍රධාන දත්ත දායකයෙක් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් හරහා ලබාගත් ඉහත දත්තය ඔස්සේ පැහැදිලි වන කාරණා ගණනාවකි. මෙහිදීද Gunnar Myrdal (1968) ගේ මෘදු රාජ්‍ය න්‍යාය ප්‍රායෝගීකරණය වේ. Myrdal (1968) ප්‍රකාශ කරන ආකාරයට, තුන්වන ලෝකයේ රටවල් බොහෝ දේ පිළිබඳව නීති පනවාගෙන තිබුණද, පරිසරය දිනෙන් දින විනාශයට පත්වෙමින් තිබේ (Myrdal උපුටාගත්තේ, මහීෂ්, 2012: 31). මෙම ජනතාව අතරද පරිසර නීති උල්ලංඝණය කරමින් ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමක් පවතින බව මෙම දත්තය හරහා පෙනී යයි.

තෙවන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යාව පිළිබඳ ප්‍රවේශයේදී සඳහන් කළ ආකාරයටම මෙකී තත්ත්ව සඳහා රාජ්‍ය වගකිව යුතු බවද කිව හැකිය. පාරිසරික වශයෙන් අවදානම් ප්‍රදේශයන්හි නිවාසස්ථාන තනා ගැනීමට, කර්මාන්තශාලා ගොඩනැගීමට අවසර ලබාදෙනුයේ රාජ්‍ය හරහාය. එහිදී පාරිසරික නීති අතික්‍රමණය කරමින් සිදු කරනු ලබන ක්‍රියාවන්ට එරෙහිව කිසිදු පියවරක් නොගැනීමෙන් රජයද එම නෛතික නොවන ක්‍රියාවන් සඳහා අනුබල ලබාදෙන බව පෙනී යයි. රාජ්‍යය විසින් ප්‍රාග්ධනය රැස් කිරීමේදී සහ ලාභ උපරිමකරණයේදී පරිසර පද්ධතිය නොසළකා හරිමින් කටයුතු කර තිබේ. ඒ සඳහා අවශ්‍ය කරන නීතිරීති වෙනස් කරමින් පෞද්ගලික සමාගම්වලට සහ ජාත්‍යන්තර සංවිධානවලට ඒවා පවරනු ලැබේ. අනෙක් අතට රාජ්‍ය, දේශපාලනඥයින් ඇතුළු සමස්ත දේශපාලන ප්‍රවාහයම ආර්ථිකය සහ මුදල මත පදනම්ව තීරණ ගන්නා මෙවන් සන්දර්භයන් තුළ පරිසරය මෙන්ම ආපදාවන්ද දේශපාලනීකරණය වීම වැළැක්විය නොහැකි වී ඇති බවද මෙම දත්තය තුළින් ද්වනිත කරවයි.

ප්‍රජාතන්ත්‍රවාදය සහ පරිසරය පිළිබඳ අනෙකුත් තර්කය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහය තුළ පරිසරය වැඩි වශයෙන් විනාශ වන බවයි. Midlarsky (1998) ගේ අදහසට අනුව ප්‍රජාතන්ත්‍රවාදය තුළ දේශපාලන නායකත්වයට තම ජනතාව සතුටු කිරීමට සිදුවන අතර, අනෙක් අතින් පුද්ගල සහ වෙනත් බලපෑම් කණ්ඩායම් සඳහා අවශ්‍ය පරිදි කටයුතු කිරීමට සිදුවේ. එහිදී එවන් බලපෑම් සහගත පුද්ගලයින් සහ කණ්ඩායම්වලට සිතැඟි පරිදි කටයුතු කිරීමට අවස්ථාව ලැබෙන හෙයින් නිරන්තරයෙන් පරිසර නීතිරීති උල්ලංඝණය වේ. එබැවින් ඉහත දත්තය අනුව මෙම ප්‍රදේශයේද දේශපාලනය හරහා කර්මාන්තශාලා හිමියන්ට වරප්‍රසාද ලබාදීමක් පැවතී ඇති හෙයින් අනවසර, හානිදායක ඉදිකිරීම් ඉහළ යාම වළක්වාගත නොහැකි වී තිබෙන බව පැහැදිලි විය.

අනෙක් අතට වැඩි ලාභ සහිත ඉඩම් මිලදීගත හැකි නාගරික වපසරියක් වන මෙම ක්ෂේත්‍රය, ව්‍යාපාරිකයින්ට කර්මාණ්තශාලා, ඉඩම් වෙළඳාම ආදියට අවස්ථාව පවතින ඉතාම ඉහළ ලාභ ඉපයිය හැකි වපසරියක් වී ඇත. එහෙයින් ආර්ථික අරමුණු මත පරිසරය ව්‍යවහාර කිරීමෙහිලා ඉතාමත් පහසුවෙන් එය වෙළඳපොල ආර්ථිකය සඳහා ගොදුරු වී ඇති බව මේ හරහා පෙනී යයි. මෙම ආර්ථික අරමුණු සඳහා පරිසරය අවභාවිතා කිරීම දේශපාලන අනුග්‍රහය සහිතව සිදුවීමත්, ඒ හේතුවෙන් ආපදාවන් සඳහා මෙම ප්‍රදේශ වඩාත් විවෘත වීමත් සිදුවී ඇති හෙයින්, පූර්ව ආපදා සන්දර්භය දේශපාලනීකරණය වී ඇති බවද මේ ඔස්සේ පැහැදිලි වේ.

Mahees ඇතුළු පිරිස (2009) ප්‍රකාශ කරන ආකාරයට ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය මුල් කරගත් අනුග්‍රාහක සේවාදායක දේශපාලන සම්බන්ධතාවය (Patron - Client Relationship) හේතුවෙන් පරිසර විනාශය ඉහළ ගොස් තිබේ. විශේෂයෙන්ම උක්ත සම්මුඛ සාකච්ඡා දත්තය තුළින් විග්‍රහයට

ලක් කළ හැකි වැදගත් කාරණාවක් වශයෙන් මෙය හඳුන්වාදිය හැකිය. දේශපාලනඥයින් සතුව මුදල්, බලය ඒකරාශී වී පැවතියද ඔවුන් මැතිවරණ ජයග්‍රහණය සඳහා ජනතාවගේ මනාප මත යැපීමක් පවතී. එම ජනතාවගේ පක්ෂපාතීත්වය ආරක්ෂා කර නොගතහොත් දේශපාලනඥයින්ට පැවැත්මක් නොමැත. මේ හේතුවෙන් ආපදා අවස්ථාවන් ඉහළ නැංවීමට තුඩුදෙන ඡන්ද දායකයින් වන එම ප්‍රජාවගේ පාරිසරික නීති උල්ලංඝණය කිරීම්වලට එරෙහි වීමට දේශපාලඥයින් උනන්දු නොවේ. එබැවින් එක් අතකින් ඊට අනුබල ලබාදෙන අතරම, අනෙක් අතින් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට මෙසේ අනවසර ඉඩම්වල තනාගත්, ගංවතුරට ලක්වන නිවෙස්වලට යටිතල පහසුකම් සැපයීම සිදු කර ඇත. මේ අනුව මෙම මැතිවරණ මනාප මත යැපීම හෙවත් අනුග්‍රාහක සේවාදායක සම්බන්ධතාවය හේතුවෙන් මෙම ගංවතුර අර්බුදය උග්‍ර කිරීම සඳහා දේශපාලනඥයින්ගේ අනිටු දායකත්වය ලැබී තිබෙන බව කිව හැකිය.

එමෙන්ම පර්යේෂණය හරහා මීට අදාළව හමුවූ තවත් දත්තයක් මෙම විග්‍රහයට එක් කළ හැකිය. ක්ෂේත්‍රයේ නිවාස සඳහා තිබිය යුතු නෛතික ඔප්පු හිමිකම සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කළ යුතුය. මෙම ප්‍රජාවගේ නිවාස බහුතරයකට නෛතික ඔප්පු නොමැති නමුත්, ඊට විකල්ප මාර්ග හරහා විසඳුම් සොයාගෙන තිබෙන බව මේ තුළින් පෙනී යයි. කිසියම් වූ රටක් සංවර්ධනය කරා යාමට නම් එම රටෙහි රාජ්‍ය නිළධාරීන් අතර සැඟවුණු උනන්දුන් නොමැති විය යුතු වේ. එසේ නොමැතිව තිරසාරව එම තත්ත්ව ලඟා කරගත නොහැකිය. මෙම ප්‍රජාව අතර නිර්මාණය වී තිබෙන මෙම තත්ත්වය මත, මුදල මත පදනම් වූ වෙනම බල ව්‍යුහයක් මෙහිලා ගොඩනැගී තිබෙන බවක් කිව හැකිය. එනම්, අනුග්‍රාහක සේවාදායක සම්බන්ධතාවය ක්‍රියාත්මක වන මෙම සන්දර්භය තුළද රාජ්‍ය නිළධාරීන් මත අවශ්‍යතාවය මත මෙම ප්‍රජාව යැපී තිබෙන බව පෙනී යයි. එමෙන්ම එම කාර්යය ආපදාපන්න ප්‍රදේශයක ජීවත්වන එම ප්‍රජාව අතර සාමාන්‍යකරණය වී ඇති තත්ත්වයක් බවද පැහැදිලි වේ. මේ අනුව නිළධාරීන් විසින් ලබාදෙන අනුග්‍රහය හේතුවෙන් පාරිසරික වශයෙන් අවදානම් ප්‍රදේශවල පාරිසරික හායනය තවතවත් ඉහළ නංවමින් ජීවත් වීමට මෙම ප්‍රජාව නැඹුරු වී තිබෙන බව කිව හැකිය. ඒ අනුව ගංවතුර ප්‍රශ්නය මතු කිරීමට මෙම දේශපාලන අනුග්‍රාහකත්වය සහ බල සම්බන්ධතා හරහා බලපෑම් කර තිබෙන බව පැහැදිලි වේ.

ආපදා දේශපාලනීකරණය සම්බන්ධයෙන් විග්‍රහ කිරීමේදී මාධ්‍ය හරහා ඇති කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමද අවශ්‍ය වේ. කිසියම් අවස්ථාවක් ආපදා අවස්ථාවක් වශයෙන් නිර්වචනය කිරීමට හෝ නොකිරීමට මාධ්‍ය ආයතනවලට හැකියාව පවතී (McKinzie, 2017). එමෙන්ම ආපදා අවස්ථාවන්වලදී දේශපාලනඥයින් බලවත් කිරීමට හෝ බල හීන කිරීමට මාධ්‍ය ආයතනයන්ට හැකියාව පවතී. අනෙක් අතට බොහෝ විට පර්යේෂණය සිදු කළ ක්ෂේත්‍රයේ දේශපාලනඥයින් මාධ්‍ය භාවිතා කර තිබෙනුයේ තම බලය ඉහළ නංවා ගැනීමටය. එනම් ආපදා අවස්ථාවන්හිදී ජනතාවට ආධාර කරන බව, ජනතාවට උපකාර කරන බව සංකේතාත්මකව පෙන්වීමට මාධ්‍ය භාවිතා කර තිබේ. ඒ තුළින් තම ප්‍රතිරූපය යාවත්කාලීන කර ගැනීමේ උත්සාහයක ඔවුන් නිරත වී තිබේ. ඒ තුළින්ද අපේක්ෂා කර තිබෙනුයේ පෙර කී මනාප සුරක්ෂිතභාවය වෙනුවෙන් අනුග්‍රාහක සේවාදායක සම්බන්ධතාවය යාවත්කාලීන කර ගැනීමයි. ප්‍රශ්නාවලි හරහා ලබාගත් දත්ත තුළින් මේ බව තවදුරටත් සනාථ කළ හැකිය.

**වගු අංක 4.1: 2016 ගංවතුර අවස්ථාවේදී දේශපාලනඥයින්ගෙන් උපකාර ලැබුණු ආකාරය**

| කාණ්ඩය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| නියමිත වේලාවටම උපකාර ලැබුණි | 3 | 7.5% |
| ප්‍රමාධ වී උපකාර ලැබුණි | 20 | 50% |
| කිසිදු උපකාරයක් නොලැබුණි | 17 | 42.5% |
| එකතුව | 40 | 100% |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත, 2017

ඉහත දත්ත අනුව ප්‍රමාධ වී දේශපාලනඥයින්ගේ ආධාර ලැබුණු බව බහුතර පිරිසක් ප්‍රකාශ කරන අතර 42.5%ක ඉහළ ප්‍රතිශතයක් ආධාර නොලැබුණු බව දක්වා තිබේ. කෙසේ නමුත් සම්මුඛ සාකච්ඡා හරහා මෙම දත්තවලට අදාළව හෙළිවූ කාරණාවක් වන්නේ මෙම ජනතාව අතර දිගු කාලයක පටන් පවතින දේශපාලන බැඳියාව හේතුවෙන් ආධාර නොලැබුනද, ප්‍රමාධ වී ආධාර ලැබුනද දේශපාලනඥයින් කෙරෙහි ඇති පක්ෂපාතීත්වය එතරම්ම අඩු වී නොමැති බවයි. විශේෂයෙන්ම ජනතාව මෙහිදී තමාට වන අපහසුතාවයන් මත දේශපාලන මතවාද වෙනස් කර ගැනීමට පෙළඹී නැත. කෙසේ හෝ ප්‍රමාධ වී හෝ ආධාර ලබා දුන් බව වැනි සාමාන්‍යකරණයන් ඔවුන් තුළ පැවතීමෙන් ඒ බව පැහැදිලි විය.

Jean Baudrillard සිය ආභාෂණ සමාජ තර්කයේදී දක්වන පරිදි සමාජයේ සත්‍යයක් ලෙස දෙයක් නොමැත. එනම් කිසිදු දෙයක් යථාර්ථය නොවන අතර, යථාර්ථය ලෙස අපට පෙනෙන දෙයක් වේ නම් එය කෘත්‍රිමව සකස් කරන ලද දෙයකි. එය හුදෙක්ම වචනයක් තවත් වචනයක් සමඟ සම්බන්ධවීමක් පමණක් වන බව ඔහු දක්වයි. ඒ අනුව ආභාෂණය යනු, සැබැවින්ම සත්‍ය දේට වඩා එහා ගිය සත්‍යයක් මෙන් පෙනෙනු ලබන ආකෘතියක් හෝ ප්‍රති-නිශ්පාදනයකි (Baudrillard, 1989). ඔහු දක්වන ආකාරයට වර්තමාන පශ්චාත් නූතන ලෝකයේ ආභාෂණය ප්‍රකාශයට පත්වනුයේ සංකේත සහ ප්‍රතිරූප හරහා වන අතර ප්‍රතිරූප හමුවේ මිනිසුන් යථාර්ථය අමතක කරනු ලැබේ. ආභාෂණය සිදු විය හැකි ආකාර හතරක් Baudrillard (1989) විසින් දක්වනු ලැබේ.

- යථාර්ථය පදනම් කරගෙන ප්‍රතිරූප ගොඩනැගීම (Image is the reflection of reality)
- ප්‍රතිරූපය මඟින් යථාර්ථය සඟවා තැබීම (The image hides the reality)
- යථාර්ථය සම්පූර්ණයෙන්ම යටපත් වීම (Total absence of reality)
- යථාර්ථයට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොවීම (There is no relation to any reality)

යනු ඒවාය. පළමු ආකාරයේදී යථාර්ථය සහ ප්‍රතිරූපය අතර එතරම්ම වෙනසක් නොමැත. නමුත් දෙවන ආකාරයට අනුව ප්‍රතිරූප මඟින් යථාර්ථය පාලනය කරනු ලබන අතර, 50%ක් යථාර්ථයද, 50%ක් ප්‍රතිරූපද මතු කරනු ලැබේ. තෙවන ආකාරයේදී යථාර්ථයක් නොමැති අතර සම්පූර්ණයෙන්ම ව්‍යාජ ප්‍රතිරූප පමණක් ඉස්මතු කෙරේ. අවසන් ආකාරයේදී යථාර්ථයට කුමන ආකාරයෙන්වත් සම්බන්ධ නොවන ප්‍රතිවිරුද්ධ යථාර්ථයක් නිර්මාණය කෙරේ. මෙම සිවුවන ආකාරය අධි-යථාර්ථය (Hyper Reality) නම් වේ (Baudrillard, 1989).

මෙහි තෙවැන්න පර්යේෂණ දත්ත විග්‍රහය සඳහා යොදාගත හැකිය. යථාර්ථය සම්පූර්ණයෙන්ම යටපත් වී තිබෙන විට ව්‍යාජ වූ ප්‍රතිරූප මත පදනම් වී යථාර්ථය තේරුම් ගැනීමට උත්සාහ කිරීම සිදුවේ. එහිදී මිනිසුන් විසින් වැළඳගනුයේ මවාපාන ලද ප්‍රතිරූප වේ. ඒ අනුව, දේශපාලනඥයින් තමාගේ ප්‍රතිරූප යාවත්කාලීන කර ගැනීමේ අරමුණින් ලබාදෙන ආධාර, ජනතාවගේ සැබෑ යහපත අරබයා ලබාදෙන ඒවා ලෙස ජනතාව විසින් පරිකල්පනය කරනු ලැබේ. එහෙයින් මහජන මතයට දේශපාලනය සම්බන්ධ වන මෙම ආකාරය මත, ජනතාවගේ මනාපය යථාර්ථයට නොව ප්‍රතිරූපයට වන බව මේ ඔස්සේ කිව හැකිය. ඒ අනුව ආපදා අවස්ථාවන් දේශපාලනීකරණය වී ඇති බව මේ තුළින්ද පසක් වේ.

එමෙන්ම ගංවතුර ආපදා අවස්ථාවන්ට ගොදුරු වී සම්පූර්ණ රජයේ ආධාර මුදලම නොලැබුණු පුද්ගලයින් දේශපාලනික වශයෙන් මෙහෙයවීමේ උත්සාහයක් ඇතැම් පක්ෂ අතර මෑත කාලයක් වන තෙක්ම නිරීක්ෂණය කළ හැකිවිය. එහිලා ආපදා අවස්ථාවේදී මෙන්ම පශ්චාත් ආපදා වකවානුවේදීත් දේශපාලනය ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍යයක් වශයෙන් ආපදා යොදා ගැනීමට උත්සුක වීම හරහා පරිසරය මුල් කරගත් දේශපාලන ක්‍රියාදාමය පෙන්වාලයි. ඒ අනුව ආපදා යනු වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය තුළ පූර්ණ වශයෙන්ම දේශපාලනීකරණයට ලක් වූ සංසිද්ධීන් වන බව මේ තුළින් පැහැදිලි වේ.


**4.2 පශ්චාත් ආපදා කළමනාකරණය සහ බල ව්‍යුහ**

ස්වභාවික ව්‍යසන කෙතරම් දරුණු වුවද, නොවැළැක්විය හැකි වුවද, ඒවා ආපදා බවට පත්වන්නේ ජනගහනය කොතරම් දුරට ඊට සූදානම්ද, නැතිද, දරාගැනීමේ හැකියාවක් තිබේද යනාදී කාරණාවන් මතය (ජයසිංහ, 2014: 56). ඒ අනුව ජනතාව ආපදා අවස්ථාවන්හිදී පීඩාවට ලක්වනුයේ මෙම තත්ත්ව සාධනය වී නොමැති විටදීය.

ආපදා කළමනාකරණය යනු, "සිදුවීමට ආසන්න ව්‍යසනයක ඵලවිපාක වළකාලීම, අවම ප්‍රමාණයකට අඩු කිරීම හෝ ඊට ප්‍රතිවිරුද්ධව කටයුතු කිරීම සඳහා හෝ ව්‍යසනයකට පසුව ඇතිවන ඵලවිපාක ජනතාව හෝ යම් පුද්ගලයෙකුට අයත්, රජයට අයත් යම් දේපළක් වෙත හෝ බලපෑම අඩු කිරීම සඳහා, අවශ්‍ය වන හෝ යෝග්‍ය වන පියවර ගැනීම වේ" (2015 අංක 23 දරණ ආපදා කළමනාකරණ පනත). යම් රාජ්‍යයක් ආපදාවකට ගොදුරු වීමෙන් පසු එම ව්‍යසන තත්ත්වයේ අහිතකර බලපෑම අවම කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගයන්ගෙන් පශ්චාත් ආපදා කළමනාකරණය සමන්විත වේ. මෙය ආපදා කළමනාකරණයේ භාරදූරම අදියර වේ (කමලරත්න සහ අමරසේකර, 2013).

ඒ අනුව, ආපදා අවස්ථාවේදී මෙන්ම පසු ආපදා අවස්ථා කළමනාකරණයේදී විවිධාකාර වූ බල ව්‍යුහ ඉස්මතු විය හැකිය. ප්‍රධාන වශයෙන්ම එම බල ව්‍යුහ විධිමත් සහ අවිධිමත් ලෙස වර්ගීකරණය කර මෙහිදී හඳුනා ගැනේ.

**රූප සටහන් අංක 5.1: පශ්චාත් ආපදා කළමනාකරණය හා සබැඳි බල ව්‍යුහ**




මූලාශ්‍රය: පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලදී.

### 4.2.1 විධිමත් බල ව්‍යුහ

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණයේ වැඩිම කාලයක් සහ වැඩිම පිරිවැයක් වැය කෙරෙනුයේ පශ්චාත් ආපදා කළමනාකරණය සඳහාය. එබැවින් මෙම අදියර වගකීමකින් යුතු ආයතනික ව්‍යුහයක් යටතේ ක්‍රියාත්මක කළ යුතුය. එකී ආයතනික ව්‍යුහය රජය, සිවිල් සමාජය, හමුදාව, විවිධ අන්තර්ජාතික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන සහ තොරතුරු මධ්‍යස්ථානවලින් යුක්ත වන අතර, ඒවා අතර මනා සම්බන්ධීකරණයක් සහිතව මෙය ක්‍රියාත්මක කළ යුතු වේ (කමලරත්න සහ අමරසේකර, 2013).

වර්තමානයේ, මෙම පශ්චාත් ආපදා කළමනාකරණය හා සම්බන්ධ නෛතික බලය සහ ඊට අදාළ වගකීම් වැඩි වශයෙන් පවතිනුයේ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයටත්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයටත්ය. ආපදා කළමනාකරණය සම්බන්ධ නෛතික සහ වෘත්තීමය, විධිමත් බල ව්‍යුහ වන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අමාත්‍යාංශය සතු වන බහුවිධ දැනුම තුළින් ඒවාට බලයක් හිමි වී තිබේ. එය නෛතික බලයටත් වඩා විශේෂඥ දැනුමක් සහිත වීම තුළින් ලැබෙන්නකි. ආපදා සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීම් සහ ඊට අවශ්‍ය වන සන්නිවේදන කර්තව්‍යය සිදු කිරීමට අදාළ දැනුම ඔවුන් සතු වේ. එහෙයින් යම් තත්ත්වයක් ආපදාවක් ලෙස නිර්වචනය කිරීම තුළින්, ආපදාව පිළිබඳ සමාජ කථිකාව ගොඩනැගීමේ බලය එම ආයතනයන්ට හිමිවන බව පැහැදිලි වේ.

Foucault (1980) බලය සම්බන්ධ විග්‍රහයේදී දක්වන කරුණක් වන්නේ බලය ක්‍රියාත්මක වන ඕනෑම තත්ත්වයක් යටතේ බලයේ ක්‍රියාවලියට ප්‍රතිරෝධතාවය දැක්වීමක් (Resistance) පවතින බවයි (Foucault උපුටාගත්තේ, Bhimrao and Jadav, 2016). ඒ අනුව මෙම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ආපදා අනතුරු ඇඟවීම් නොතකා සිටි ප්‍රතිචාරිකයින් ක්ෂේත්‍රයේදී හමුවීම තුළින් එම කරුණද පැහැදිලි වේ. එනම් අදාළ බලය පිළිගැනීම නොකර සිටීමක් ප්‍රජාව අතර පැවතී තිබේ. ඒ අනුව, මෙම කථිකා සම්පාදන බලය ජනප්‍රිය සංස්කෘතිය හේතුවෙන් වැඩි වශයෙන්ම ඇත්තේ ජන සන්නිවේදන මාධ්‍යවලට බව කිව හැක්කේ එමගින් ජනතාව වෙත අදාළ

ආපදා තත්ත්ව සම්බන්ධයෙන් ගෙනයන තොරතුරු හරහා ආපදාවේ ස්වභාවය සහ බරපතලභාවය සම්බන්ධයෙන් සංකල්පරූපීය කථිකාවක් නිර්මාණය කරන හෙයින් යැයි කිව හැකිය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුවනුයේ දැනුම තුළින් තත්ත්වය මතුපිටට ගෙන පෙන්වීමේ බලයයි. එය ජනතාව අතරට ගෙනයාමේ ඉහළ ශක්‍යතාවයක් ජන සන්නිවේදන මාධ්‍ය සතුවේ.

පශ්චාත් ආපදා කළමනාකරණයේදී මැදිහත්වන බල ව්‍යුහ අතර රාජ්‍ය නොවන සංවිධානද විධිමත් අංශයට ගත හැකිය. ශ්‍රී ලංකාවේ මෙම රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ආරම්භය 1955න් පසුව සිදුවී ඇති අතර, ආරම්භක යුගයේදී ආගමික කටයුතු, මානව අයිතිවාසිකම් සුරැකීම, ආර්ථික සංවර්ධනය, කාන්තා හා ළමා ගැටලු, පාරිසරික ගැටලු, සංස්කෘතික කටයුතු සහ ආබාධිත, මහළු පුද්ගලයින්ට අවශ්‍ය සේවා සැපයීමේ අරමුණු සහිතව ඒවා ක්‍රියාත්මක වී ඇත (Wanigaratne, 1997). විශේෂයෙන්ම 19 වන සියවස ආරම්භයේ පටන්ම ඉහළ යමින් පැවති ආපදා තත්ත්ව හමුවේ රාජ්‍යයට පමණක් ආපදා තත්ත්ව සම්බන්ධයෙන් මැදිහත්වීම සංකීර්ණ කර්තව්‍යයක් වූ හෙයින්, රාජ්‍ය නොවන සංවිධානයන්ගේ මැදිහත්වීම වැදගත් වී තිබේ.

> "ගංවතුර වෙලාවෙ අපිට රතු කුරුසෙ, සර්වෝදයෙ මහත්වරු ඇවිත් ආධාර දුන්නා. බෝට්ටු යන සීමාවෙ හිටිය අයට ඉක්මනට ආධාර ලැබුනත් අපිට ආධාර ලැබෙන්න පරක්කු වුනා. බෝට්ටුවලට එන්න අමාරු තැන්වලට රජයේ ආධාර එන්නෙම නැති තරම්, මේ NGO මහත්වරු තමා ඇවිත් අපට පිහිට වුනේ. ඒවාගෙන් ගොඩක් බඩු බෙදන නිසා මිනිස්සු ඒවා වැඩිපුර ගන්නත් මඟ බලාගෙන හිටියා.." (අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මේ අනුව විධිමත් බල ව්‍යුහයන් වශයෙන් මෙම රාජ්‍ය නොවන සංවිධාන, ජනතාවට සහන සැලසීමට මැදිහත් වී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයක් සහිත රාජ්‍යයන්හි පාරිසරික අර්බුද සම්බන්ධයෙන් ප්‍රජාතන්ත්‍රවාදය හේතුවන සේම, මෙම පාරිසරික ව්‍යසනකාරී තත්ත්වයන්ට පිළිතුරු සැපයීමටද ප්‍රජාතන්ත්‍රවාදයට සිදුවන බව කිව යුතුය. ඒ අනුව ඒ සඳහා සුභසාධන සංකල්ප මත පිහිටා නිර්මාණය වී ඇති මෙම රාජ්‍ය නොවන සංවිධාන පශ්චාත් ආපදා කළමනාකරණය සඳහා ඉතාම වැදගත් වී තිබෙන බව මේ තුළින් පැහැදිලි වේ. කෙසේ නමුත් මෙම සංවිධාන සතුව තිබෙන ආර්ථික ශක්‍යතාවයන් හේතුවෙන් මොවුන් ජනප්‍රියත්වය අරමුණු කරගෙන, රාජ්‍ය අංශ සමඟ තරඟකාරීව ආපදා සහනාධාර සැපයීමේ කර්තව්‍යය සිදු කිරීමට උත්සුක වීම මත, භෞතික සංවර්ධනය සඳහා දිගුකාලීන සහ ඵලදායී මැදිහත්වීමක් සිදු කිරීමට මේවා අපොහොසත් වී ඇත.

අනෙක් අතට රාජ්‍ය නොවන සංවිධානයන්හි මැදිහත්වීම සහනාධාර සම්බන්ධයෙන් වීම මත, යැපීමේ මානසිකත්වය ආපදාවට පත්වූ ප්‍රජාව අතර වර්ධනය වී තිබේ. මූල්‍යමය ශක්‍යතාවය මත මේවා ආර්ථිකමය වශයෙන් ශක්තිමත්භාවයක් දැරූ නමුත්, ක්‍රමවත් නොවන ආපදා සහන අවශ්‍යතා තක්සේරුකරණය හේතුවෙන් මේවා හරහා අධික ලෙස පරිභෝජනය කුළුගන්වන ආපදා වාණිජකරණයකට මඟ පාදා තිබෙන බව කිව හැකිය.

### 4.2.2 අවිධිමත් බල ව්‍යුහ

එක්සත් ජාතීන්ගේ ආපදා කළමනාකරණ වැඩසටහන්වලදී ආසියානු මට්ටමේ සිට ලෝක මට්ටම දක්වා ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීමේදී මෙන්ම, ආපදා කළමනාකරණ තීරණ

ගැනීමේ සමුළුවේදීද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යාලෝකයට වැඩි වැදගත්කමක් ලබාදී ඇත. ආපදා කළමනාකරණයේදී ස්ත්‍රී - පුරුෂ සම්බන්ධතා මනා ලෙස යොදාගැනීමේ වැදගත්කම එහිදී අවධාරණය කර තිබේ. එය කාන්තාවට පක්ෂපාතී වූ වැඩපිළිවෙලක් නොවන නමුත් ආපදා කළමනාකරණයේදී කාන්තාවට කළ හැකි කාර්යභාරය ඉහළ වන හෙයින්, ඒ තුළදී කාන්තාවට වැඩි අවධානයක් යොමු කරයි (UNICEF, 2018).

කාන්තාවට ආපදා අවස්ථාවන්හිදී අනුවර්තනය වීමේ හැකියාව වැඩි බව විවිධ පර්යේෂණ හරහා පෙන්වාදී තිබේ. එබැවින් ආපදා කළමනාකරණයේදී කාන්තාව සහ පරිසරය අතර තිබෙන ව්‍යුහාත්මක සම්බන්ධතාවය පිළිබඳව අවධානයට ලක් කළ යුතුම බව කිව යුතුය. පර්යේෂණ දත්ත තුළින් මේ සම්බන්ධයෙන් විග්‍රහ කළ හැකිය.

> "ගංවතුර වෙලාවෙ මෙහෙ පිරිමින්ට වඩා වගකීම් කරට අරන් වැඩ කරපු ගැහැණු අය දෙතුන් දෙනෙක් හිටියා. බෝට්ටුවල නැගල ගිහින් කෑම බෙදන්න, හිරවෙලා ඉන්න අයව බේරගන්න දෙපාරක් හිතන්නෙ නැතුව එයාලා ආවා. කඳවුරුවල කලබලෙන් ඉන්න මිනිස්සුන්ව සන්සුන් කරන්න පිරිමි අපිට අමාරු වුනත්, ගොඩක් ගැහැණු අය ඒක පහසුවෙන්ම කළා.." (අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මීට ප්‍රථමයෙන් කාන්තාව අවදානම් සමූහයක් ලෙස හඳුනාගැනීමේ ගැටලු තුළදීද අවදානම් සංස්කෘතියට අනුගත වූ කාන්තාවන්ගේ ශක්‍යතා තුළින් ඔවුන් බලගැන්වී තිබෙන බව දක්වන ලදී. දේශපාලනය නිසා ආපදාවක් ඇති විය හැකි සේම, ආපදාව නිසා දේශපාලනයක් ඇති විය හැකිය. ආපදා වැනි අවස්ථාවලදී දේශපාලනය තුළ කාන්තා නායකත්වය වැඩි වශයෙන් ඉස්මතු විය හැකිය. එමෙන්ම මේ හරහා තවදුරටත් ආපදා අවස්ථාවන්හිදී නායකත්ව ගුණාංග සහිත ආකර්ෂණීය කාන්තා නායකත්වයන් ඉස්මතු වන බව හඳුනාගත හැකිය. උක්ත දත්තය තුළ එවන් ආපදා අවස්ථාවන්හිදී මැදිහත් වී කටයුතු කිරීම පිරිමින් සතු කර්තව්‍යයක් වන බවට සමාජයේ තිබෙන දෘෂ්ටිවාදය ඉස්මතු කෙරෙන නමුත්, කාන්තා බල ව්‍යුහයන්ද මෙසේ ඉස්මතු වීම තුළ, කාන්තාවන් සාම්ප්‍රදායික වගකීම් වෙත පමණක් ලඝු නොවෙමින් කටයුතු කිරීමට මෙම ආපදා අවස්ථාව සන්දර්භයක් බවට පත් කරගෙන තිබෙන බව පෙනී යයි. අනෙක් අතට, කාන්තාවගේ තිබෙන පාරම්පරික කාර්යභාරය තුළින් ආපදාවට ලක් වූ සමාජයට සේවයක් කළ හැකි බවද මෙහිදී පෙනී යයි. එතුළින් නැතිවී ගිය සමාජ සම්බන්ධතාවයන් නැවත ගොඩනගා ගැනීමට පිරිමියාට වඩා ගැහැණියට ඇති හැකියාව වැඩි බව පෙන්වාලයි. ඒ අනුව සමාජ ව්‍යුහය නැවත ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි කාන්තාවගේ දායකත්වය ඉතාමත් වැදගත් වන බව මෙහිදී කිව හැකිය.

කෙසේ නමුත් ආපදා කළමනාකරණය තුළ සිවිල් සමාජ කාන්තා ක්‍රියාකාරීත්වය ඉහළ ගොස් තිබෙන බව පර්යේෂණය තුළින් සනාථ වීම වැදගත් වේ. මේ අනුව 2016 ගංවතුර ආපදා අවස්ථාවේදී ක්ෂේත්‍රයේ ඉස්මතු වූ අවිධිමත් බල ව්‍යුහ වශයෙන් කාන්තා බල ව්‍යුහ මෙසේ හඳුනාගත හැකිය.

ගංගාශ්‍රිත ගංවතුර අවස්ථාවකදී ප්‍රථමයෙන්ම පිටාර තැන්නේ ජීවත්වන ප්‍රජාව ඊට ගොදුරුවන අතර, නාගරික වපසරියේදී බොහෝ දුරට පහත් බිම්වල ජීවත්වන ප්‍රජාව ක්ෂණික ගංවතුරට ගොදුරු වේ. ඒ අනුව ගංවතුරෙන් ඇතිවන බලපෑම අඩු කර ගැනීම සඳහා ප්‍රජාව විසින්ම විවිධ ක්‍රියාමාර්ග ගැනීමේ

අරමුණින් ඒකරාශී වීම තුළින් ප්‍රජාමූල බල ව්‍යුහ පිබිදීම සිදුවේ (ලියනාරච්චි, 2017). එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ආපදා අවදානම් ඇති රටවල ආපදා අවදානම අඩු කිරීම සහ ප්‍රජාව ඒවාට මුහුණදීම සඳහා සූදානම් කිරීම අරමුණු කරගෙන ප්‍රජාමූල ගංවතුර කළමනාකරණය හඳුන්වාදී තිබේ. විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ අනුග්‍රහය සහිතව මෙම කර්තව්‍යය සිදු කිරීමට වර්තමානයේ අවධානය යොමුවී තිබෙන අතර, ජාතික ගංවතුර අවදානම් සැලැස්ම සකස් කිරීමේදී මෙම වැඩසටහන සමඟ සම්බන්ධීකරණය වී තිබේ (Disaster Management Centre, 2017).

මෙම රාජ්‍ය අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක වන ප්‍රජාමූල වැඩසටහන් ක්ෂේත්‍රයේදී හමු නොවූ නමුත් අවිධිමත් ආකාරයේ ප්‍රජාමූල බල ව්‍යුහයක් හඳුනාගත හැකිවිය. ගංවතුර අවස්ථාවන්හිදී ප්‍රජාවට සහන සැළසීම සහ ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණි, ප්‍රජාව මූලික කරගත් සමාජ සමූහයක් ආපදා සන්දර්භය තුළින් මතු වී තිබේ. "කිසියම් පොදු අරමුණක් වටා ඒකරාශී වූ පිරිසක්" ලෙස සරලව සමූහයක් යන්න අර්ථකථනය කළ හැකි අතර, සමූහ ප්‍රධාන වශයෙන්ම ප්‍රාථමික සමූහ සහ ද්විතියික සමූහ ලෙස වර්ග වේ (Lane, 1973: 302). Cooley (1909) ප්‍රකාශ කරන ආකාරයට, "ඉතාමත් සමීප, පෞද්ගලික සහ ඍජු අන්තර් සබඳතා පවත්වන කුඩා සහ අවිධිමත් සමූහ ප්‍රාථමික සමූහ වේ" (Cooley උපුටාගත්තේ, ජයසිංහ, 2013: 194). මින් වෙනස්ව ද්විතියික සමූහ අතර අන්තර්ක්‍රියා සිදුවන්නේ විධිමත් සහ අපෞද්ගලික රටාවකටය (ජයසිංහ, 2013: 196).

ඒ අනුව මෙම තරුණ පිරිස් අතර ගොඩනැගී තිබෙන මෙම සමූහය, ප්‍රාථමික සමූහයක් වශයෙන් හඳුනාගත හැකිය. එහිදී මෙම ප්‍රාථමික සමූහය ගංවතුර ආපදා සහිත සන්දර්භය තුළ සිදු කර තිබෙන කාර්යභාරය, බාහිර පාර්ශවයන්ට මඟ පෙන්වීමට පැවති හැකියාව සහ ඊට අදාළ දැනුම සහිත වූ හෙයින් ප්‍රජාමූල බල ව්‍යුහයක් බවට පත්වී තිබෙන බව කිව හැකිය. එබැවින් මෙම සමූහය අදාළ සන්දර්භය පාලනය කිරීමට මෙන්ම ඒකාග්‍ර කිරීමට හේතු වී තිබෙන බව පෙනී යයි.

අනෙක් අතට, මෙම ප්‍රජාවට අවශ්‍ය මෙහෙයවීම ලබාදී තිබෙනුයේ ආගමික නායකත්වය තුළින් වීමද සුවිශේෂීව කැපී පෙනේ. ඒ අනුව ආගමික නායකයින් විසින් සිදු කළ මෙම මෙහෙයවීම හේතුවෙන්, ප්‍රජාමූල බල ව්‍යුහ තුළින් ආගමික බල ව්‍යුහ ඉස්මතු වී තිබෙන බවද කිව හැකිය. එහිදී ජනවාර්ගික සංහිඳියාව ප්‍රමුඛ වී තිබෙන මෙම සන්දර්භය තුළ, වෙනත් ආගමික බල ව්‍යුහ ඉස්මතු වී නොමැති නමුත් මෙම ආගමික නායකත්වය තුළින් සිදු කළ මෙහෙයවීම, ජනවර්ග ද්විත්වයේම තරුණ කොටස් මෙම කර්තව්‍යයට සම්බන්ධ වීමට බලපා තිබේ. එබැවින් ආගමික බලය සමාජ සමූහ මෙහෙයවීමටත්, ඒවා පාලනය කිරීමටත් සමර්ථ වී තිබෙන හෙයින්, මෙම සන්දර්භය තුළින් ආගමික නායකත්වය, ආගමික බල ව්‍යුහයක් ලෙස ඉස්මතු වී තිබෙන බව කිව හැකිය. ඒ අනුව ආපදා සන්දර්භය තුළින් ප්‍රජාමූල බල ව්‍යුහ ඉස්මතු වන බවත්, එම සන්දර්භයන්හි ආගමික නායකත්වය මුල් කරගත් ආගමික සංස්ථාව බලය සහිත ව්‍යුහයක් බවට පත්වී තිබෙන බවත් කිව හැකිය.

## 5. නිගමනය

දේශපාලනික බල සම්බන්ධතා මඟින් ගෝලීය මෙන්ම ප්‍රාදේශීය පාරිසරික වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රමුඛ පෙළේ බලපෑමක් සිදු කරනු ලැබේ. ඒ අනුව පාරිසරික දේශපාලනය මුල් කරගත් අනුග්‍රාහක සේවාලාභී දේශපාලන සම්බන්ධතා ආපදා සන්දර්භයන් උත්පාදනය කිරීමට අවශ්‍ය පරිසර වෙනස්කම් ඇති කරලීමට පසුබිම සකස් කර තිබේ. දේශපාලනය තුළින් ආපදාවක් ඇති විය හැකි සේම ආපදාව තුළින්ද දේශපාලනයක් ඇති විය හැකිය යන්න මෙම සන්දර්භයේ විවිධාකාර වූ බල ව්‍යුහ ඉස්මතු වීම තුළින්ද සනාථ වේ. ඒ අතර ආගමික බල ව්‍යුහය පශ්චාත් ආපදා සන්දර්භ තුළ අනෙකුත් බල ව්‍යුහ පාලනය කිරීමේ අවිධිමත් බල අධිකාරිය බවට පත්වී ඇති අතර, ප්‍රජාවගේ පසු ආපදා මානසික පීඩනය සමනය කිරීමේ අවිධිමත් කාරකය බවටද පත්වී තිබේ. අනෙක් අතට ආපදා සහන සැළසීමේ අදියරේදී දේශපාලනඥයින්ගේ සංකේත සහ ප්‍රතිරූප යාවත්කාලීන කරගැනීමේ ව්‍යාජ යථාර්ථයන් නිර්මාණය කරන්නාවූ සන්දර්භයන් බවටද දේශපාලනීකරණය වූ ආපදා සන්දර්භ පත්වී තිබේ.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


කමලරත්න, ටී. සහ අමරසේකර, ඩී. (2013). **ව්‍යසන කළමනාකරණය උදෙසා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ භූමිකාව: දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පශ්චාත් සුනාමි ව්‍යසන කළමනාකරණ ක්‍රියාවලිය.** සමාජ විමසුම. පේරාදෙණිය: සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව.

ජයසිංහ, ඒ. කේ. ජී. (2013). **සමාජ විද්‍යාව, සමාජය සහ සංස්කෘතිය**. කඩවත: කඩුල්ල ප්‍රකාශන.

ජයසිංහ, ආර්. (2014). **ශ්‍රී ලංකාවේ ස්වභාවික ආපදා කළමනාකරණය: න්‍යාය හා ක්‍රමවේද**. ගාල්ල: සවිය සංවර්ධන පදනම.

මහීෂ්, එම්. ටී. එම්. (2012). **සංවර්ධනය හා පාරිසරික දේශපාලනය**. පාර්ලිමේන්තු පර්යේෂණ සඟරාව. කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව.

ධනපාල, එච්. ඒ. සහ ආරියසේන, එස්. (2004). **පරිසරය, මානුෂ අවශ්‍යතා සහ සංවර්ධනය.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

රත්නායක, එම්. (2007). **දේශගුණ උපද්‍රව: නිවර්තන, වාසුළි, ගංවතුර, නියඟ, අකුණු හා ටොනාඩෝ.** මාතර: කර්තෘ ප්‍රකාශන.

ලියනාරච්චි, පී. (2017). **ශ්‍රී ලංකාවේ ගංවතුර උපද්‍රවය, ක්‍රියාවලිය, බලපෑම සහ කළමනාකරණය.** අංගොඩ: කර්තෘ ප්‍රකාශන.

Baudrillard, J. (1989). *Simulacra and Simulation*. United States: University of Michigan Press. Available on: http://www.e-reading.club_3486 [Accessed on: 3rd January 2018].

Berger, P. and Luckmann, T. (1966). *The Social Construction of Reality: A Treatise in the Sociology of Knowledge*. England: Penguin Books.

Bhimrao, R. and Jadhav, D. (2016). *A Conceptual Study of Post-modernism with reference to Jean Baudrillard, Michael Foucault, Jean Francois, Lyotard and Jacques Derrida*. India: Dr. Ambedkar Marathwada University. Available on:http://hdl.handle.net/1060 [Accessed on: 5th January 2018].

Bryant, R. L. and Bailey, S. (1997). *Third World Political Ecology*. London: Routledge. Available on: https://we.riseup.net/assets//317005 [Accessed on: 25th September 2017].

Darier, E. (1999). *Discourses of the Environment*. United States: Blackwell and Sons Publishers Ltd. Available on: www.scribd.com/doc/244412229 [Accessed on: 27th August 2017].

Foster, J. B. (2000). *Marx's Ecology: Materialism and Nature*. New York: Monthly Review Press. Available on: http://pdfs.semanticscholar.org.4741 [Accessed on: 15th January 2018].

International Federation of Red Cross (2015). *Annual Report*. Sri Lanka: IFRC.

Lane, D. (1973). *The Role of Social Groups*: *Social Groups on Polish Society.* London: Palagram. Available on: https://doi.org/10.1007/978-1-349-01101 [Accessed on: 1st March 2018]

Mahees, M. T. M. (2010). *Environmental Movements in Sri Lanka: A case study of grassroots action against a coal power plant*. Germany: VDM Publisher.

Mahees, M. T. M., Sivayogantham, C. and Basnayaka, B. F. A. (2009). *Political Economy of Water Pollution in River Mahaweli*. Kandy: Water Resources Research by Geo Informatics Society of Sri Lanka. Available on: http://archieve.com.ac.lk.8080/research/handle/70130/422 [Accessed on: 29th December 2017].

McKinzie, A. E. (2017). *Deconstruction of Destruction Stories: Narrative, Inequality and Disasters*. Overseas Development Institute. United States: Wiley and Sons. Available on: http://journals.sabepub.com/doi/abs/10.1177/223. [Accessed on: 23rd October 2017].

Midlarsky, M. I. (1998). *Democracy and the Environment: An Empirical Assessment*. Journal of Peace Research. United States: Sage Publication. Available on: http://www.jstor.org/stable/424940 [Accessed on: 21st September 2017].

Smith, O. (1996). *Anthropological Research on Hazards and Disasters.* Annual Review of Anthropology. United States: Annual Reviews Publication. Available on: http://links.jstor.org/sici=0084-6570%281996%292%3A25 [Accessed on: 02nd February 2016].

Stott, P. A. and Sullivan, S. (2000). *Political Ecology: Science, Myth and Power*. United Kingdom: Oxford University Press. Available on: https://philipapers.org/rec/stops [Accessed on: 2nd August 2017].

UNICEF. (2018). *Gender Action Plan 2018 – 2021*. Colombo 07: United Nations Organization.

Wanigaratne, R. (1997). *The State – NGO Relationship in Sri Lanka: Rights, Interests and Accountability*. London: McMillan Press.